3 වන පිටෙන්

විරුද්ධව සිය නීතියම ක්‍රියාදාමයන් ඉටු කර ගැනීමේ නොහැකියාවක් රහස් පොලිසිය තුළින් ඉස්මතු වී ඇත. එබැවින් රහස් පොලිසියත් තම ශරීර සෞඛ්‍යයේ ආරක්‍ෂාව උදෙසා දුම්න්ද සිල්වා අත් අඩංගුවට ගැනීමට නීතිපතිනී ඊවා වනසුන්දර ගේ උපදෙස් පතා ඇත. දැනට මාස කිහිපයක් ගතවී ඇතත් ඊට අදාළ නීතිපති උපදෙස් ලැබී නැත.

එසේ නම්, රටේ අපරාධ රැල්ල වැඩිවීමට හේතුව පොලිසියේ වරදින් බව ප්‍රකාශ කරන නීතිපතිනී ඊවා වනසුන්දර මහත්මිය දුම්න්ද සිල්වා නැමැති අපරාධකරුවාව අත් අඩංගුවට ගැනීමට නොහැකි වී ඇත්තේ පොලිසියේ වරදින්ද? තම වරදින්ද? යන්න මෙනෙහි කර බැලීම ඊවා වනසුන්දර මහත්මියගේ නීතිපතිධූරයට වඩාත් සුවදායකය. සාමාන්‍යයෙන් කිසියම් අපරාධකරුවෙකු අත් අඩංගුවට ගැනීම උදෙසා අධිකරණය නියෝග කල විට ඒ සඳහා නීතිපති උපදෙස් අවශ්‍ය වන්නේ නැත. සිදුකළ යුත්තේ අධිකරණ නියෝග අනුව ඔහුව අත් අඩංගුවට ගැනීමය.

නමුත් මෙය දේශපාලන ප්‍රශ්නයක් නිසා රහස් පොලිසියත් සිදුකළේ අයගේ පතේ නොගෑවෙනසේ අත් මේස් දමාගෙන වැඩේ කිරීමේ පරමාර්ථයෙන් යුතුව හීන් නූලෙන් බෝලය නීතිපති දෙපාර්තමේන්තුව වෙත තල්ලු කර යැවීමය.

එක් පැත්තකින් බලන විට රහස් පොලිසිය මෙහිදී ඉතාමත්ම සූක්‍ෂම ලෙස ක්‍රියා කර ඇති බව පෙනේ. ඊට අදාළව නීතිපතිනියටත් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ලබාදීමේ හැකියාව තිබිණි. නමුත් අදය එම යුතුකම මේ වනතුරුත් ඉටුකර නැත. එසේනම්, මෙහි වරද ඇත්තේ පොලිසියේද? නීතිපතිනියගේද? යන්න මැදිහත් සිතින් විමසා බැලීම වටී. රටේ අපරාධ මර්දනය කිරීමට නොහැකිවීම පිළිබඳව පොලිසියට ඇඟිල්ල දිගු කරන නීතිපතිනිය මෙමගින් සිදුකර ඇත්තේ හරියට උඩ බලාගෙන කෙළ ගැසීමකි.

එපමණක් නොව, අප කවිරුත් දන්නා ආකාරයට වරක් දුම්න්ද සිල්වා බාල වයස්කාර දැරියක් ලිංගික අපයෝජනයට යොදා ගත් බවට චෝදනා එල්ල විය. ඒ සම්බන්ධයෙන් පොලිසිය නිසි පරීක්‍ෂණයක් පවත්වා ඔහුව අත් අඩංගුවට ගෙන රිමාන්ඩ් භාරයට පවා පත් කෙරිණි. පොලිසිය මෙහිදී තම යුතුකම් නිසි ලෙස ඉටු කිරීමට පියවර ගැනිණි. එම අසමජාති ක්‍රියාව සිදුකරනවිට දුම්න්ද සිල්වා එක්සත් ජාතික පක්‍ෂ ප්‍රබලයෙකි. බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙකි. අවසානයේ දුම්න්ද සිල්වා තමන්ට එල්ල වී තිබූ අපචාර චෝදනාවෙන් හා සිය සොහොයුරා වූ රෙනෝද සිල්වාගේ ''හිරු එෆ්.එම්.'' ගුවන් විදුලි නාලිකාව සම්බන්ධයෙන් ඇතිවූ ප්‍රශ්න බේරා ගැනීම උදෙසා එක්සත් ජාතික පක්‍ෂයෙන් ඉවත්වී මහින්ද රාජපක්‍ෂ ආණ්ඩුවට එකතුවිය.

මෙම ආණ්ඩු මාරුවත් සමඟ දුම්න්ද සිල්වාට එල්ලවී තිබූ චෝදනා තඹුව ඉල්ලා අස්කර ගැනීමට තරම් නීතිපතිවරයා පියවර ගැනිණි. එමගින් සිදුවූයේ අපචාර චෝදනාව සම්බන්ධයෙන් පරීක්‍ෂණ පැවැත්වූ පොලිස් නිලධාරීන්ට පවා අතපය හකුලා ගෙන පැත්තකට වී බකන් නිලාගෙන සිටීමටය. එසේනම්, මෙම ස්ත්‍රීදූෂණ හා මිනීමරු චෝදනා එල්ල වී ඇති දුම්න්ද සිල්වා නැමැති අපරාධකාරයාව බේරා ගැනීමට පියවර ගෙන ඇත්තේ කවිද ? පොලිසියද නීතිපතිවරයා ද? යන්න ඕනෑම අයෙකුට වැටහෙන දෙයකි.

නීතිපතිධූරය යනු, ස්වාධීන තනතුරක් නොවේ. එම තනතුරට අදාළ පුද්ගලයාව පත් කරනුයේ රටේ ජනාධිපතිවරයා වශයෙන් මහින්ද රාජපක්‍ෂ මහතාය. එවිට අනිවාර්යයෙන්ම නීතිපතිධූරය ආණ්ඩුවේ රූකඩයක් වනවා ඇත. මේ වන විට සිදුවී ඇත්තේ එයයි.

වත්මන් නීතිපතිනී ඊවා වනසුන්දර මහත්මිය සිය ධූරයට පත්වූ මුල් අවස්ථාවේ රැස්වීමකට සහභාගී වෙමින් ප්‍රකාශ කර සිටියේ ''කාන්තාවක් වශයෙන් තමන්ට මෙම තනතුර ලැබේයැයි කිසිදු විශ්වාසයක් නොතිබුණු බවය. නමුත් තමන් ගැන පූර්ණ විශ්වාසය තබා ජනාධිපතිවරයා තමාව නීතිපතිධූරයට පත් කිරීම පිළිබඳව එතුමාට ස්තූතිවන්ත වෙන බව කියා සිටියාය.

ඊවා වනසුන්දර මහත්මිය ප්‍රකාශ කළ දෙය ඇත්තය. එම තනතුරට පත්වීමට සිටි නියම සුදුස්සා නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් සේනරාළ ප්‍රියසාද් ඩෙප් මහතාය. ඔහු කාගේවත් අත්තාවාදී දේශපාලන ගැත්තෙක් වීමට අකමැති අයෙකි. වරක් ඔහුට ආරක්‍ෂක ලේකම් ඝෝෂිතය රාජපක්‍ෂ මහතා තමාව අමාත්‍යාංශයට පැමිණ හමුවන ලෙස ප්‍රකාශ කර තිබිණි. නමුත් ආත්ම ගරුත්වය ඇති අයෙකු ලෙස ප්‍රියසාද් ඩෙප් මහතා ඔහුව හමුවීමට ගොස් තිබුණේ නැත.

මෙම කරුණු කාරණා හා තවත් බෝහෝ දේවල් පාදක කරගෙන ප්‍රියසාද් ඩෙප් මහතාට නීතිපතිධූරය ලබා දුන්නේ නැත. සිදුවූයේ ඔහුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකු ලෙස මාරුකර යවා නීතිපතිධූරය ඊවා වනසුන්දර මහත්මියට ලබාදීමට ආණ්ඩුව පියවර ගැනීමය. එවැනි ස්වභාවයක් තුළ නීතිපතිධූරය ලබාදීම පිළිබඳව ඊවා වනසුන්දර මහත්මිය ජනාධිපතිවරයාට සුබ පැතීම සාධාරණය. නමුත් ප්‍රශ්නය ඇත්තේ එය නොව, තම ධූරය ආණ්ඩුවේ සියලු මිනීමරුවන්, ස්ත්‍රී දූෂකයන්, වංචාකාරයන් හා අපරාධකාරයන් බේරා ගැනීමට භාවිතා කළහොත් ඇතිවන තත්ත්වය කුමක්ද? යන්නය.

මෙය ඊවා වනසුන්දර මහත්මියට පමණක් අදාළ කරුණක් නොවේ. මීට පෙර මෙම තනතුරේ සිටි මොහාන් පීරිස් ඇතුළු තවත් සමහර අය ක්‍රියා කළේද බොහෝ විට ආණ්ඩුවේ දේශපාලන පදයටය. මේ නිසා නීතිපතිධූරය අපරාධකරුවන්ට හා ආණ්ඩුවේ සමාප දූෂකයන්ට රැකවරණය සපයන ස්ථානයක් බවට පත්වී ඇත.

පිඳියන්දල, නාමිපමුණුව සමුපකාර ඡන්දයේදී පුද්ගලයෙකු වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ලවූ හිටපු නියෝජ්‍ය අමාත්‍ය චන්දන කලුආරච්චි මහතාව බේරා ගැනීමට පියවර ගත්තේ නීතිපතිවරයාය.

රුපියල් ලක්‍ෂ 10 ක පමණ සමෘද්ධි සහනාධාර මුදල් වංචා කිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ලවී ඉන් බේරීම උදෙසා එක්සත් ජාතික පක්‍ෂයේ සිට ආණ්ඩුවට එකතුවී නියෝජ්‍ය ඇමැතිධූරයක් ලබාගත් අබ්දුර් කාදර් මහතාව බේරා ගැනීමට පියවර ගත්තේ කවිද ? වෙන කවිරුවත් නොව, නීතිපතිවරයාය.

මිනීමැරුම් චෝදනා එල්ලවී වැරදිකරුවන් බවට පත්වූ සබරගමුව බස්නායක නිලමේ ඇන්ටන් තෙන්නකෝන් හා ජ්‍යෙෂ්ඨ අමාත්‍ය මිල්රෝයි ප්‍රනාන්දු

නියෝජ්‍ය අමාත්‍ය සරණ ගුණවර්ධන විසින් මිනුවන්ගොඩ ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකුට තර්ජනය කර රුපියල් ලක්‍ෂ 250 ක කප්පමක් ඉල්ලා තිබිණි. එම මුදල ලබා නොදුන්නහොත් මරා දමන බවට ඇමැතිවරයා ව්‍යාපාරිකයාට තර්ජනය කර තිබිණි.

මහතාගේ බිරිඳට ජනාධිපති සමාව දී හිරෙන් නිදහස් කළේ කවිද?
මූල්‍ය වංචා සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ මහනුවර නාගරික මන්ත්‍රී කේසර ස්නානායක හා මෙර ක්‍රියාවලට අධිකරණයෙන් වැරදිකරුවී සිරගතවීමට නියම වූ අමාත්‍ය ආරමුගන් තොන්ඩමන් යන අයට ජනාධිපති සමාව ලබාදී ඉන් ඔවුන්ව නිදහස් කර හැරියේ කවිද?

ඒ වෙන කවිරුවත් නොව, ඊවා වනසුන්දර මහත්මියව නීතිපති තනතුරට පත් කළ රටේ විධායක ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මහතාය.

මෙම නිදර්ශණ තුළින් පෙන්නුම් කෙරෙන්නේ කුමක්ද? ආණ්ඩුවේ හිතවතුන් හා බලවතුන් මොන අපරාධ, මැරවැඩ, වංචනික ක්‍රියා හා අසීක්තිකමේ කළද ඔවුන්ව හරි හරියට තරඟයට බේරා ගැනීමට ජනාධිපතිවරයා හා නීතිපතිවරයා මැදිහත්වී ඇති බවය.

මෙලෙස යනවිට නීතියට අත්වන කලඳසාව කුමක්ද? ආණ්ඩුවේ ආවතේවකාරයෝ තරඟයට අපරාධ හා බලුවැඩ සිදුකරන විට හා උන්ව ඉන් බේරා ගැනීමට ආණ්ඩුවේ බලවතුන් ක්‍රියා කරන විට නීතිය පිළිබඳව ජනතාවට ඇති විශ්වාසය හා මතය කුමක්ද ? පසුගිය කාල පරිච්ඡේදය තුළ මේ රටේ වැඩිපුරම අපරාධ සිදුකර ඇත්තේ කවිද ? කුඩු ජාවාරමකට අදාළව ඇතිවූ ප්‍රශ්නයක් මත කහවත්තේ මව හා දියණිය ඝාතනය කළේ කවිද? අමාත්‍ය ජෝන් සෙනවිරත්න මහතාගේ සම්බන්ධීකරණ ලේකම් එල්.එම්. ධර්මසිරි ඇතුළු පවුලේ සහචරයන් පිරිසක් විසිනි. ඔවුගේ පුතාද කුඩු ජාවාරම් සම්බන්ධයෙන් ඉන්නේ රක්‍ෂිත බන්ධනාගාරගතවය. පූජාපිටිය ප්‍රදේශයේදී පසුගියදා තරුණියක් පැහැරගෙන ගොස් දූෂණය කර තිබුණේ ආණ්ඩු පක්‍ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු විසිනි.

නංගල්ලේ දී විදේශීය ජාතික තරුණයෙකු ඝාතනය කර ඔහුගේ පෙම්වතියව දූෂණය කළේ ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකු විසිනි. ඔහු මහින්ද රාජපක්‍ෂගේ පමණක් නොව නාමල් රාජපක්‍ෂගේ ද අති ජාත මිත්‍රයෙකි.

වැලිගෙපොළ ප්‍රාදේශීය සභාවේ ආණ්ඩු පක්‍ෂයේ මන්ත්‍රීවරයෙකු විසින් ඉතාමත් සාහසික ලෙස තරුණයෙකුට පහරදී මරා දමා තිබිණි. හඟුරන්කෙත ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට මධ්‍යම පළාතේ සභාවේ සභාපති සාලින්ද දිසානායක විසින් පහරදී තිබිණි. ඔහු අමාත්‍ය එස්.බී. දිසානායකගේ සහෝදරයාය. කයිටිස් වලදී දෙමළ ළාබාල දැරියක්ව ආණ්ඩුව නියෝජනය කරන අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතාගේ පක්‍ෂයේ අයෙකු විසින් දූෂණය කර ඉතාමත් තිරිසන් ආකාරයට ගල් වලින් පහරදී මරා කැළෑවක දමා තිබියදී පොලිසියට හමුවිය.

නියෝජ්‍ය අමාත්‍ය සරණ ගුණවර්ධන විසින් මිනුවන්ගොඩ ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකුට තර්ජනය කර රුපියල් ලක්‍ෂ 250 ක කප්පමක් ඉල්ලා තිබිණි. එම මුදල ලබා නොදුන්නහොත් මරා දමන බවට ඇමැතිවරයා ව්‍යාපාරිකයාට තර්ජනය කර තිබිණි. මේ පිළිබඳව එම ව්‍යාපාරිකයා ජනාධිපතිවරයාට ඇතුළු සියලුම වගකිව යුත්තන්ට ඉතිහාස දැනුම් දුන්නද, කිසිදු පරීක්‍ෂණයක් සිදු කළේ නැත. මෙම ඇමැතිවරයා මීට පෙර ද ඉන්ධන පිරවුම්හල් හිමියෙකුගෙන් රුපියල් ලක්‍ෂ 80 ක කප්පමක් ලබාගෙන තිබිණි. ඒ ගැන එම පිරවුම්හල් හිමියා බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මාර්ගයෙන් ජනාධිපතිවරයාට දැනුම් දී තිබිණ. නමුත් සිදුවූ පරීක්‍ෂණයක් නැත.

අමාත්‍ය මර්වින් සිල්වා පුතා හා ගෝලබාලයෝ කැලණිය සුරපුරයක් නොව මැරපුරයක්, කප්පම් පුරයක් හෙවත් කුඩු පුරයක් කර ඇත. ඔහුට විරුද්ධව ඔහුගේම පක්‍ෂයේ අය ජනාධිපතිවරයාට කර ඇති පැමිණිලි සංඛ්‍යාව කෙළවරක් නැත. නමුත් සිදුවී ඇත්තේ කුමක්ද? කිසිදු පරීක්‍ෂණයක් නැත. මර්වින් සිල්වා ප්‍රකාශ කරන්නේ රාජපක්‍ෂවරු ලංකාවේ රජ කරනතුරු මර්වින් සිල්වාට කිසිදු කරදරයක් නොවන බවය.

එමගින් ප්‍රකාශ වන්නේ කුමක්ද? මර්වින් සිල්වා සියළු දුරාචාර වැඩ සිදුකර යහතින් වැජඹෙන්නේ මහින්ද රාජපක්‍ෂගේ ආරක්‍ෂාව ඔහුට ලැබෙන නිසාය. එසේ නොවේ නම්, ඔහු කරන තිරිසන් වැඩ වලට එරෙහිව රාජපක්‍ෂ ආණ්ඩුව නිසි පියවරක් ගත යුතුය. නමුත් එවැනි පරීක්‍ෂණයක් පිළිබඳව නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කරන බවක් පෙනෙන්නට නැත. රාජපක්‍ෂවරුන්ටත් අවශ්‍ය වන්නේ මෙවැනි තිරිසන් වැඩ කරන පුද්ගලයන් බව මින් අපට කියාපාන පාඩමයි.

වර්තමානය වන විට ඉතිහාසයේ කිසිදු නොවූ විරූ ආකාරයේ අපරාධ රැල්ලක් රට පුරා දියත් වී ඇත. ඒ සියලු අපරාධකාරයන් පිටුපස ජීවමාන චරිත ලෙස ක්‍රියා කරන්නේ ආණ්ඩුවේ දේශපාලනඥයන් සහ ඔවුන්ගේ සහචරයන්ය.

ඔවුන්ට විරුද්ධව නිසි නීතිමය පියවරක් ගැනීමට ආණ්ඩුව උත්සාහ කරන්නේ නැත. සිදුවී ඇත්තේ අපරාධකාරන්ට ආණ්ඩුවෙන්ම රැකවරණය සැලසීමකි. ඔවුන්ට විරුද්ධව ක්‍රියා කරන පොලිස් නිලධාරීන්ට පමණක් නොව, වෙනත් පුද්ගලයන්ට පවා ආණ්ඩුවෙන්ම අත්වන්නේ අවාසනාවන්ත ඉරණම් වලට ගොදුරුවීමටය.

මෙවැනි ස්වභාවයක් තුළ පොලිසිය පවා බොහෝ දුරට නීතිය අකුරට ඉටු කිරීමට දක්වන්නේ මැලිකමකි. නීතිය ඉටු කිරීමට ගොස් ඔවුනුත් නැති ප්‍රශ්න ඇතිකර ගැනීමට කැමති නැත. එබැවින් ඔවුනුත් පවතින තත්වය තුළ තම පැවැත්ම සහතික කර ගැනීමේ තැනක සිට ක්‍රියා කිරීමට උත්සාහ කරන බවක් පෙනේ.



මෙමගින් අද වන විට රට තුළ ආණ්ඩුවත්, නීතියත්, පොලිසියත් මිනිසුන් ගණන් ගන්නේ නැති තත්වයකට වැටී ඇත. මේ තුළ අපරාධ සංස්කෘතිය එන්න එන්නම වැඩිවීමට හේතු පාදක වී ඇත.

මේ සැබෑ ප්‍රශ්නය තේරුම් නොගෙන හෝ තේරුමක් ඇතත්, ඒ කෙරෙහි නිසි අවධානයක් යොමු නොකර සතය යටපත් කරමින් නීතිපතිනී ඊවා වනසුන්දර මහත්මිය රට තුළ මෙතරම් අපරාධ වැඩිවීමට හේතුව පොලිසියේ වරදින් යැයි සියලු කුණු ගොඩවල් පොලිසිය පිටින් දමා ඇඟ බේරා ගැනීමට උත්සාහ කිරීම එතරම් ප්‍රඥාගෝචර ක්‍රියාවක් නොවේ.

මෙමගින් අප පොලිසිය නිවැරදි යැයි ප්‍රකාශ කරන්නේ නැත. මේ අසමජාති දේශපාලන ක්‍රමය තුළ පොලිසියත් නිතැතින්ම තිරිසන් වී ඇත. ඒ ගැන කිසිදු විවාදයක් නැත. අපරාධ වැඩිවීමට පොලිසියේ අසංවර ක්‍රියා කලාපයන් මුල් වී ඇත. ඒ ගැන අළුත් කතාවක් අවශ්‍ය නැත.

නමුත් මේ රටේ අපරාධ රැල්ල වැඩිවීමට එකම හේතුව පොලිසිය නොවන බව අපගේ හැඟීමයි. එය මේ තිරිසන් දේශපාලන, සංස්කෘතික, ආර්ථික හා සමාජ ක්‍රමය බෙහෙවින් ඉවහල් වී ඇත. එය ගුණාත්මක හා ප්‍රමාණාත්මක ආකාරයට නිවැරදි නොකර අපරාධ නැති කිරීම යනු දවල් සිහිනයක් පමණක් වනු ඇත.

ශ්‍රී ලාල් ප්‍රියන්ත